සැකසුම :- ආර්.කේ.තරංගා මධවන්ති මිය ර/ඇඹි /කාවන්තිස්සපුර ම.වි. 5 ශ්‍රේණිය බාර



Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School


- **ආදරණීය දූවේ පුතේ,**

අංක 01 කාඩ්පත

| | |
|---|---|
| | උදෑසනින් අවදි වී පාසල් යයි. |
| | රසවත් ආහාරයක් පිළියෙල කරයි. |
| | ඉතා වේගයෙන් දුවයි. |
| | පහසුවෙන් කාන්තාරය තරණය කරයි. |
| | දිය බීමට එයි. |
| | ගීත ගායනා තරගයට සහභාගි වූවා ය. |
| | බොහෝ වෙහෙස මහන්සියෙන් මුදල් ඉපයූවේ ය. |
| | කැප වීමෙන් ඉගැන්වීම් කටයුතුවල නිරත වූවේ ය. |
| | රෝග පරීක්ෂා කළේ ය. |
| | දක්ෂ ලෙස රඟපෑවේ ය. |

අංක 02 කාඩ්පත

| | |
|---|---|
| ළමයා | ඔටුවා |
| අශ්වයා | මුවා |
| ගුරුවරයා | නළුවා |
| ශිෂ්‍යාව | වෛද්‍යවරයා |
| මව | පියා |

අංක 03 කාඩ්පත

| | |
|---|---|
| ළමයෙක් | ඔටුවෙක් |
| අශ්වයෙක් | මුවෙක් |
| ගුරුවරයෙක් | නළුවෙක් |
| ශිෂ්‍යාවක් | වෛද්‍යවරයෙක් |
| මවෙක් | පියෙක් |

අංක 1 කාඩ්පතෙන් පිටපත් 02ක් සාදා ගන්න

අංක 2 හා 03 කාඩ්පත් වලින් 01 බැගින් සාදා ගන්න.

දැන් අංක 02 කාඩ්පතේ ඇති වචන කපා අංක 01 කාඩ්පතේ නිවැරදි පරිදි අලවන්න.වැඩිහිටියකුට පෙන්වා නිවැරදි කර ගන්න.

දැන් අංක 03 කාඩ්පත නැවත අනෙක් අංක 01 කාඩ්පතේ අලවන්න වැඩිහියකුට පෙන්වා නිවැරදි කරගන්න.

මෙම ඇලවූ සියලුම නාමපද "**<u>ප්‍රාණවාචී ඒකවචන නාමපද</u>**" වේ.

'ළමයා' කියූ විට අප දන්නා/නිශ්චිත ළමයෙකු බවත්, 'ළමයෙක්' කියූ විට කුමන ළමයෙක් දැයි හරි හැටි නොදන්නා/නිශ්චිත නොවන බව දැනගන්න.

දැන් මෙම කාඩ්පත් දෙක නිවසේ එල්වා තබන්න.